# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2063/21 - 2018 මාර්තු මස 20 වැනි අඟහරුවාද - 2018.03.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය:-IR/COM/03/W/2015/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

අන්තර් සමාගම් සේවක සංගමය, නො. 259/ 9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.( සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

සීමාසහිත ලංකා සීනි ( පුද්ගලික) සමාගම, නො. 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වු ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මහනුවර, හෙද පුහුණු පාසල,විදුහල්පති නිල නිවස,එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.


1A - G27333 - 22 (2018/03)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*මගේ අංකය:-* IR/ COM/03/W/2015/98.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

අන්තර් සමාගම් සේවක සංගමය, නො. 259/ 9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.( සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

සීමාසහිත ලංකා සීනි ( පුද්ගලික) සමාගම, නො. 27, මෙල්බෝන් ඇවනිව්, කොළඹ 04.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

" වසර 20 කට අධික කාලයක් සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ අනියම් රියදුරන් ලෙස සේවය කළ පී . එල්. ගයාන්, එච්. එම්.එම්. කුමාර, ඩී. එම්. ජේ. බණ්ඩාර සහ ජේ. එන්. එස්. ජයසිංහ යන සේවකයන් සිවුදෙනාට ස්ථිර පත්වීම් ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුනට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

04-156

---

*මගේ අංකය :-* IR/ 07/15/2013 (A).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03, ( සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

හලාවත වැවිලි සමාගම, නො. 165, පුත්තලම් පාර, හලාවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කලුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය:*- IR/ 07/15/2013 (A).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03, ( සේවකයන් 04 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

හලාවත වැවිලි සමාගම, නො. 165, පුත්තලම් පාර, හලාවත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

'' හලාවත වැවිලි සමාගමේ සේවයේ යෙදී සිටින බී.එම්. කනුෂ්කා තරින්දි, එච්.ජී.ඒ.අයි. ප්‍රසාදි, ඩබ්.එස්.එන්. සුරංගිකා, ඩබ්.ජේ.ආර්. ප්‍රනාන්දු යන සේවක සේවිකාවන්ට ඔවුන්ගේ සේවා ගිවිසුමේ කොන්දේසිවලට අනුව වසරක පුහුණු කාලයකින් පසුව අදාළ ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය නොකිරීම යුක්ති සහගත ද? එසේ නොවේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්,

2018 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

04-157

---

*මගේ අංකය:*- IR/07/15/2013 (B).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03, ( සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

හලාවත වැවිලි සමාගම, නො. 165, පුත්තලම් පාර, හලාවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් :

කළුතර, නාගොඩ,ශ්‍රී සොභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දීය.

*මගේ අංකය:-* IR/ 07/15/2013 (B).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරයවන කාර්මික ආරවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

ලංකා වතු සේවා සංගමය, අංක 06, ඇලෝයි මාවත, කොළඹ 03.( සේවකයින් 05 දෙනෙකු වෙනුවෙන්)

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :-*

හලාවත වැවිලි සමාගම, නො. 165, පුත්තලම් පාර, හලාවත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

'' හලාවත වැවිලි සමාගමේ සේවයේ යෙදී සිටින එම්.වී.ඩී. දිල්හානි සංජීවනී, ජී.ඩී. අප්සරානි පෙරේරා, ටී.එම්.එම්.ආර්. සුවාරිස්, එල්.එස්.එල්. රණවීර සහ ඩබ්. පී. ලක්ෂිකා දිල්හානි යන සේවක සේවිකාවන්ට ඔවුන්ගේ අදාළ ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කළ දිනය පසුදාතම් නොකිරීම යුක්ති සහගත ද? එසේ නොවේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේද? යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්,

2018 පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

04-158

*මගේ අංකය:*- IR/COM/01/E/2015/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
**4(1) වන වගන්තිය යටතේ නියෝගය.**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන් :-*

1. කේ. කේ. ජයසේන මයා, අංක 19, පළමු පටුමග, ජම්බුගස්මුල්ල පාර, නුගේගොඩ.

2. එන්.එස්.ඩී. නවරත්න මයා, 2 කණුව, මල්පන්දෙනිය වත්ත, බුලුරුප්ප, හෙට්ටිමුල්ල.

3. යූ. කේ. නන්ද මයා, අංක 68, ඉසිවර පෙදෙස, කුරුඳුවත්ත, වලහන්දූව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :*

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, අංක 354/2, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්ත්‍රිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් :

රත්මලාන, සිරිමල් උයන, අරලිය මාවත, අංක 03. ආර්.එස්.ආරියප්පෙරුම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 මාර්තු මස 16 වැනි දින,
කොළඹ දීය.

*මගේ අංකය:* IR/COM/ 01/E/2015/181.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරයවන කාර්මික ආරවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන් :*

1. කේ. කේ. ජයසේන මයා, අංක 19, පළමු පටුමග, ජම්බුගස්මුල්ල පාර, නුගේගොඩ.

2. එන්.එස්.ඩී. නවරත්න මයා, 2 කණුව, මල්පන්දෙනිය වත්ත, බුලුරුප්ප, හෙට්ටිමුල්ල.

3. යූ. කේ. නන්ද මයා, අංක 68, ඉසිවර පෙදෙස, කුරුඳුවත්ත, වලහන්දූව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන් :*

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, අංක 354/2, නිපුණතා පියස, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

" (1) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීමට 2014 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවය කළ කේ. කේ. ජයසේන මහතාට එම තනතුර නොලැබීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න සහ එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහු වෙත හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත්,

(2) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ ( සැලසුම්, පර්යේෂණ හා සංවර්ධන) තනතුර සඳහා බඳවා ගැනීමට 2014 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවය කරන එන්. එස්. ඩී. නවරත්න මහතාට එකී තනතුර නොලැබීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්න සහ එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහු වෙත හිමි විය යුතු සහනයන් කවරේද යන්නත්,

(3) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂ (පුහුණු), අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන, රැකියාගත කිරීම් සහ විශේෂ ව්‍යාපෘති), අධ්‍යක්ෂ (සැලසුම්, පර්යේෂණ සහ සංවර්ධන තනතුර සඳහා බඳවා ගැනීමට 2014 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවය කරන යූ.කේ. නන්ද මහතාට එකී තනතුරක් නොලැබීමෙන් අසාධාරණයක් සිදු ව තිබේද? යන්න සහ එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහු වෙත හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ".

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018ක් වූ පෙබරවාරි මස 27 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

04-159

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.